# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.07.27 පැය 1235 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1470 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**කතරගම වැඩසිටිකන්ද පුදබිමේ ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම .**

කතරගම ඓතිහාසික වැඩසිටිකන්ද පුදබිමේ විහාරාධිපති හිමියන් විසින් එම පුදබිමේ ආරක්ෂාව සඳහා ස්ථාපිත කර තිබූ පොලිස් මුරපොලෙහි රාජකාරි නිලධාරීන් ඉවත් කර ඇති බවට සඳහන් කර ගරු ජනාධිපති තුමා වෙත යොමු කරන ලද ලිපියක් මේ දිනවල සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ සංසරණය වෙමින් පවතී.

මේ පිළිබඳව කතරගම පොලිස් ස්ථානාධිපතිවරයා වෙතින් වාර්තාවක් කැඳවන ලද අතර ඒ අනුව එම පුවතෙහි කිසිදු සත්‍යතාවයක් නොමැති බවට එමගින් මා වෙත කරුණු වාර්තා කර ඇත.

ඒ අනුව, වැඩසිටිකන්ද පුදබිමෙහි ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පොලිස් හා යුධ හමුදා නිලධාරීන් පිරිසක් යොදවා එහි ආරක්ෂාව තහවුරු කර ඇති බවත් පුද්ගලානුබද්ධ ආරක්ෂාව නොව ස්ථානයේ හා බැතිමතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගෙන ඇති බවටත් එමගින් මා වෙත වාර්තා කර ඇත. වැඩසිටිකන්ද පොලිස් මුරපොලට අනුයුක්තව සිටි අතිරික්ත නිලධාරීන් ඉවත් කර එම නිලධාරීන් කතරගම පොලිස් වසමේ නීතිය හා සාමය ස්ථාපිත කිරීමේ රාජකාරි සඳහා යොදවා ඇති අතර එම ලිපියේ සඳහන් පරිදි වැඩසිටිකන්ද පුදබිමේ පොලිස් ආරක්ෂාව පූර්ණ වශයෙන් ඉවත් කර නොමැති බවටද වාර්තා කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**